# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,508 — 1965 සැප්තැම්බර් 17 වැනි සිකුරාද — 1965.9.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම භාෂාවකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | 133 | මෝස්තර ආඥපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | 134 | | |


සැලකිය යුතුයි.— (1) 1963 ජනවාරි සිට ජූනි දක්වා නිකුත් අංක 13,457 සිට 13,690 තෙක් ඇති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවන්ට සූචියක් මෙම ගැසට් පත්‍රයට අතිරේකයක් වශයෙන් පළවේ.

(2) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ V වැනි කොටසේ කුලී මෝටර් රථ සේවාවන් පැවැත්වීම සඳහා මගින් ගෙනයාමෙ අවසරපත් ඉල්ලීමෙ අයදුම්පත් ලැයිස්තුවක් පළවේ.

## වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුය.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

ආණ්ඩුවේ නිවාඩු දිනයන් හැරුණු විට සතියේ සෙනසුරාද හැර සෑම දිනකම දහයේ සිට හතර දක්වාද, සෙනසුරාද දිනවල දහයේ සිට එක දක්වාද ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර සතියේ දිනවල සවස 3 දක්වා ද, සෙනසුරාද දිනවල දවල් 12 දක්වාද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් (වෙළෙඳ ලකුණු ආඥපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ) තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිවම කාර්යාලයීය අංකය සමඟ දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

### විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නො කරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමඟ ටී. ඇම්. 7 දරන ෆෝරමය මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබනොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවකාශයක් සැළසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර, සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නො කළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නො කළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සළකා බැලීමේ දී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්යය හැර හැර කිරීමද සැළකිල්ලට ගනු ලැබේ.

# පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන

## දැන්වීමයි

පහත දැක්වෙන විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—


**වර්ෂ 1964 ක් වූ අගෝස්තු මස 18 වන දින දරණ 5494 වන අංකය (61.2.13 දින සහ 898, 596 වන අංකය දරණ එක්සත් රාජධානි පේටන්ට් බලපත්‍රය, 46 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම)**

**IMPERIAL CHEMICAL INDUSTRIES LIMITED**


" හයිපොකොලෙස්ටෙරොලීමික් සංයුති වැඩි දියුණු කිරීම හෝ ඒ පිළිබඳ වූ "

**සංක්ෂේප සටහන :—**

මෙම නිර්මාණයේ ස්වභාවය, පහත දැක්වෙන 1 වන අයිතිය ප්‍රකාශ කිරීමෙන් නිශ්චය කර ගත හැක :—




නැමැති සූත්‍රය ඇති යටත් පිරිසෙයින් කාබොක්සිලික් අම්ල ව්‍යුත්පන්න එකක්වත් අන්තර්ගත වූ හෝ එයින් සමන්විත වූ ඖෂධීය සංයුති. මෙහි A වූ කලී ඔක්සිජන් පරමාණුවක් හෝ ඉමිනො ඛණ්ඩකයක් හෝ වෙයි. $R_1$ වූ කලී හයිඩ්‍රජන් පරමාණුවක් හෝ ඇල්කිල් ඛණ්ඩකයක් හෝ වෙයි. $R_2$ වූකලී ඇල්කිල් ඛණ්ඩකයක් වෙයි ; නොඑසේ නම් සයික්ලොඇල්කිල් වලයක් සෑදීමට යාබද කාබන් පරමාණුවක් සමගම $R_1$ සහ $R_2$ එකට බැඳී තිබීමට පුළුවන. X වූකලී පෙනිල් ඛණ්ඩකයක් හෝ—නැප්තිල් ඛණ්ඩකයක් හෝ (මෙම නැප්තිල් ඛණ්ඩකය, කලින් මෙහි දී විස්තර කරනු ලැබූ පරිදි අවශ්‍ය ලෙස ආදේශ කළ හැකි වෙයි.) හෝ එස්ටරයක් නැති නම් එහි ලවණයක් හෝ වෙයි. X නැමැති ද්‍රව්‍ය සමග,




නැමැති සූත්‍රය ඇති, යටත් පිරිසෙයින් ඇන්ඩ්‍රොස්ටෙන් ව්‍යුත්පන්න එකක්වත් මිශ්‍ර කොට ඇත. මෙකී සූත්‍රයේ $R_3$ වූකලී හයිඩ්‍රජන් පරමාණුවක් හෝ හයිඩ්‍රොක්සි මෙතිලීන් ඛණ්ඩකයක් හෝ වෙයි. $R_4$ වූකලී හයිඩ්‍රොක්සි ඛණ්ඩකය හෝ ද්විබන්ධිත ඔක්සිජන් පරමාණුවක් හෝ වෙයි. $R_5$ වූකලී හයිඩ්‍රොක්සි ඛණ්ඩකය වෙයි. $R_6$ සහ $R_7$ එකම වෙයි ; නොඑසේ නම් ඒවා වෙනස් වෙයි. $R_6$ සහ $R_7$ යන මේ එකිනෙක හයිඩ්‍රජන් පරමාණුවක් හෝ මෙතිල් ඛණ්ඩකයක් හෝ නිරූපණය කරයි. නොඑසේ නම් $R_5$ සහ $R_6$ එක් ව ද්වි බන්ධිත ඔක්සිජන් පරමාණුවක් නිරූපනය කරයි. මේ සඳහන් සූත්‍රයේ 4— සහ 5—නැමැති ස්ථානවල කාබන් පරමාණු බඳවන බන්ධනය, අවශ්‍ය පරිදි ද්විත්ව බන්ධනයක් වෙයි. නොඑසේ නම් පළමුව සඳහන් සූත්‍රයේ X වූකලී කාබොක්සිලික් අම්ල එස්ටරයක් වෙයි. තව ද අවශ්‍ය නම් විශ නොවන, ඖෂධීය ව පිළිගත හැකි තනුකාරකයක් නොහොත් වාහකයක් සමග X නැමැති ද්‍රව්‍ය මිශ්‍ර කොට තිබිය හැකියි.

අයිතිය ප්‍රකාශ කිරීම් 12ක්ද නිදසුන් 16ක් ද වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

වර්ෂ 1965ක් වූ ජූලි මස 23 වන දින,
කොළඹ දී ය.

9-311

---

## දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**1964 අගෝස්තු 11 වැනි දින අංක 5491.**

" දෙන් පෝල් චන්ද්‍රසිංහ සහ සීමාසහිත වෝකර් පුත්‍ර සහ සමාගමය."

" සමකාලික යන්ත්‍රයක් තේ කර්මාන්තශාලාවල සහ එවැනි වෙනත් කර්මාන්තශාලාවල ජනක/මෝටර් යන දෙවිධියට භාවිත කිරීමේ ක්‍රමයක් ".

**සංක්ෂේප සටහන :—**

නිෂ්පාදනයේ සවභාවය පහත විස්තර වන අංක 1 දරණ හිමිකර යෙන් දත හැකි ය :—

1. තේ කර්මාන්තශාලාවෙක ඇති අතිරේක ප්‍රත්‍යාවර්තකයක් දෙවිධියකට භාවිත කිරීමෙන් හෙවත් සාමාන්‍ය අවස්ථාවල දී භාරයෙන් කොටසක් ගෙන යෑම හා මූළු ජව සාධකය වැඩි දියුණු කිරීම සඳහා අති-උත්තේජිත සමකාලික මෝටරයක් වශයෙනුත් විදුලි බලය අත්හිටවුණු අවස්ථාවල දී එක් එක් යන්ත්‍රයට විදුලිය සැපැයීම පිණිස, දැනටමත් තිබෙන ප්‍රාථමික චාලකයට සංයුග්ම කළ ප්‍රත්‍යාවර්තකයක් වශයෙනුත් යන දෙයාකාරයට භාවිතයට යොදා ප්‍රයෝජනයට ගැනීමේ ක්‍රමයෙකි. මෙහි දෙවැනි අවධියේ දී පළමු සමකාලික මෝටරය ගෙන ගිය භාරය ප්‍රාථමික චාලකය මගින් ගෙන යනු ලැබෙයි.

හිමිකර 10ක් සහ රූප සටහන් පත්‍ර 7ක් ඇත.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් රෙජිස්ට්‍රාර්.

1965 ජූනි 11 වන දින,
කොළඹ දී ය.

9-619

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති නැතට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි